10

# කථකලි නෘත්‍ය නාටක කෙරෙහි දක්ෂිණ භාරතීය ගැමි නාටකවල දායකත්වය

*අයි. එම්. එල්. ගුණවර්ධන* [1]

HU/2011/2320

දකුණු ඉන්දියාවෙහි විවිධ ප්‍රදේශවල ප්‍රචලිත ගැමි නැටුම් ඒ ඒ ප්‍රදේශ තුළට ආවේණික සංස්කෘතික ලක්ෂණ කැටි කර ගනිමින් නිර්මාණය වී ඇත. එම ගැමි නාටකවල දක්ෂිණ භාරතීය ගැමි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව මැනවින් ඉදිරිපත් කර දක්වයි. කථකලිය ද මෙකී ගැමි නාටකයන් තුළ ඇති එක් එක් අංගයන් කැටි වී සකස් වූ ප්‍රාසංගික කලාවක් ලෙස හඳුනාගත හැකිය. කථකලි රංගය ප්‍රභවය වීමෙහිලා දක්ෂිණ භාරතිය ගැමි නාටකයන් ඍජුවම දායක වී ඇති බැව් සඳහන් වේ. මෙලෙස පාදක වූ දකුණු ඉන්දීය ගැමි නාටක අතරින් යක්ෂගාන, කුඩියාට්ටම්, චාක්කියාර්කුත්තු, කලරිපායාට්ටු, ඔට්ටම් ථුල්ලල්, භූතම් තෙයියම්, රාමනාට්ටම්, ක්‍රිෂ්ණාට්ටම් යන ගැමි නාටක කථකලි කෙරෙහි දායක වී ඇති ආකාරය විමසීම ප්‍රධාන ලෙස අවධානයට බඳුන් වන අතර එකී ලක්ෂණ කෙබඳු ආකාරයකින් කථකලි නර්තනය තුළට මුසු වී එහි වර්ධය සඳහා ඉවහල් වී ඇත්ද යන්න විග්‍රහ කිරිම මෙම පරික්ෂණ පත්‍රිකාවෙහි මූලික අරමුණ වේ.දක්ෂිණ භාරතිය ගැමි නාටක තුළට පොදු වූ ලක්ෂණ සියල්ලක්ම කථකලි නෘත්‍ය නාටකයට දායාද කරගත් බැව් තහවුරු විය. මෙම අධ්‍යයනය සඳහා විමර්ශන ලෙස සම්භාව්‍ය සාහිත්‍ය හා පුරාණ සාහිත්‍ය කලාවෙන් ලද දායකත්වය, රංගභූමිය, වලක නම් වූ පොල්තෙල් පහන, වේදිකාවෙහි අල්ලනු ලබන කෙටි තිරය, ශීර්ෂ පළඳනා හෙවත් කිරිටම් භාවිතය, වේශ භූෂණ හා රංග වස්ත්‍රාභරණ භාවිතය, සියලු චරිත පිරිමින් විසින් පමණක් සිදු කිරිම, චතුර් අභිණය, සංගිතය හා වාද්‍ය භාණ්ඩ භාවිතය, වර්ණ වෙස් මෝස්තර හා අංග රචනා යන කාරණා සියල්ල මුල් කාලීනව ගැමි නාටක තුළ දක්නට ලැබී ඇති බවත් පසුකාලීනව එහි ආභාසය තුළින් ගොඩනැගුණු කථකලි නෘත්‍ය නාටකය තුළ එම අංගයන් සංකීර්ණත්වයට පත්ව ප්‍රේක්ෂකයා අතරට පැමිණ ඇති බැව් අවබෝධ කර ගැනීමට හැකියාව ලැබුණි. මේ අනුව අධ්‍යයනයේ ප්‍රතිඵල ලෙස කථකලි නෘත්‍ය නාටක කෙරෙහි දක්ෂිණ භාරතිය ගැමි නාටකවල දායකත්වය ලැබී ඇති බව තහවුරු කරගත හැකි විය.

ප්‍රමුඛ පදඃ කථකලි, දක්ෂිණ භාරතීය ගැමි නාටක, කුඩියාට්ටම්, ශීර්ෂාභරණ, යක්ෂගාන

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) තෙවන වසර*